ප්‍රවෘත්ති අධ්‍යක්ෂ /ප්‍රවෘත්ති සංස්කාරක **2018 මාර්තු 21**

# ප්‍රවෘත්ති නිවේදනය

## ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2013 = 100) : 2018 පෙබරවාරි

## ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය

දුරකථනය: 011-2147414 ෆැක්ස්: 011-2877945 ඊමේල්: prices@statistics.gov.lk

ජාතික පාරිභෝගික මිල දර්ශකය නිකුත් කරමින් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය අමර සතරසිංහ මහතා 2018 පෙබරවාරි මාසයේ ලක්ෂ්‍යාමය උද්ධමනය 3.2%ක් දක්වා අඩු වූ බව ප්‍රකාශ කලේය. පසුගිය ජනවාරි මාසයේ ලක්ෂ්‍යාමය උද්ධමනය 5.4%ක් ලෙස වාර්තා විය. තවද 2016 අප්‍රේල් මාසයේ සිට වාර්තාවූ අවම උද්ධමනය 3.2% වාර්තා වූයේ 2018 පෙබරවාරි මාසයේදීය. මෙම මාසයේ උද්ධමනය පහළ යාමට 2017 පෙබරවාරි මාසයට සාපේක්ෂව 2018 පෙබරවාරි මාසයේ ආහාර ද්‍රව්‍යවල පැවැති අඩු මිල මට්ටම් හේතු වී ඇත. මෙම මාසයේ උද්ධමනය සඳහා ආහාර කාණ්ඩයේ 1.6%ක හා ආහාර නොවන කාණ්ඩයේ 1.5%ක දායකත්වයක් පිළිවෙලින් ලබා දී ඇත. එහෙත් 2017 පෙබරවාරි මාසයේ 8.2% ක්වූ උද්ධමනයට ආහාර කාණ්ඩයේ දායකත්වය 4.5%ක් හා ආහාර නොවන කාණ්ඩයේ දායකත්වය 3.8%ක් විය.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ මාසික වෙනස්වීම සංසන්දනය කලවිට, 2018 ජනවාරි මාසයේ 125.8ක් වූ දර්ශක අගය 2018 පෙබරවාරි මාසයේ 123.7ක් දක්වා පහළ යාමක් වාර්තා විය. පසුගිය මාසය හා සංසන්දනය කලවිට 2018 පෙබරවාරි මාසයේ දර්ශකාංක 2.1ක අඩුවීමක් එනම් 1.7ක ප්‍රතිශතකාංක අඩුවීමක් වාර්තා විය. මෙම මාසික වෙනස්වීමට ආහාර කාණ්ඩයේ වියදම්වල වටිනාකම 1.96%කින් අඩුවීම හා ආහාර නොවන කාණ්ඩයේ වියදම්වල වටිනාකම 0.35%කින් වැඩිවීම දායක වී ඇත.

ආහාර කාණ්ඩයේ වියදම්වල වටිනාකම අඩුවීම සඳහා එළවළු, අමු මිරිස්, රතුළූණු, සහල්, ලොකුළූණු, කෙසෙල්, මයිසූර් පරිප්පු, අළුත් මාළු, අර්තාපල්, සීනි, දෙහි සහ පැපොල් යන ආහාර ද්‍රව්‍යවල මිල අඩුවීම බලපා ඇත. එසේ වුවත් පොල්, මිරිස් කුඩු සහ කුකුල් මස් යන ආහාර ද්‍රව්‍යවල වියදම්වල වටිනාකම වැඩිවීමක් වාර්තා වී ඇත.

පසුගිය මාසය හා සංසන්දනය කලවිට, 2018 පෙබරවාරි මාසයේ ආහාර නොවන කාණ්ඩයේ වියදම්වල වටිනාකම වැඩිවීම සඳහා 'අධ්‍යාපන', 'සෞඛ්‍ය', 'රෙදිපිළි හා පාවහන්', 'විවිධ භාණ්ඩ හා සේවා', 'නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන', 'ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු', 'මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ හා මත්ද්‍රව්‍ය', 'ප්‍රවාහන' සහ 'විනෝදාත්මක හා සංස්කෘතික' යන කාණ්ඩවල වියදම්වල වටිනාකම වැඩිවීම බලපා ඇත. තවද 'ආපනශාලා හා හෝටල්', යන කාණ්ඩයේ වියදම්වල වටිනාකමෙහි ඉතා සුළු වැඩිවීමක් වාර්තා වේ. මෙම මාසය තුළ 'සන්නිවේදන' කාණ්ඩයේ වියදම්වල වටිනාකම නොවෙනස්ව පැවතුණි.




**ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම : 2013 = 100)**

| වර්ෂය | මාසය | දර්ශකාංකය | දර්ශකාංකයේ මාසික වෙනස්වීම (%) | ලක්ෂ්‍යමය උද්ධමනය (%) |
|---|---|---|---|---|
| **2017** | පෙබරවාරි | 119.9 | 0.5 | 8.2 |
| | මාර්තු | 119.5 | -0.3 | 8.6 |
| | අප්‍රේල් | 121.0 | 1.3 | 8.4 |
| | මැයි | 121.8 | 0.7 | 7.1 |
| | ජුනි | 123.4 | 1.3 | 6.3 |
| | ජූලි | 122.4 | -0.8 | 6.3 |
| | අගෝස්තු | 122.3 | -0.1 | 7.9 |
| | සැප්තැම්බර් | 123.3 | 0.8 | 8.6 |
| | ඔක්තෝම්බර් | 124.8 | 1.2 | 8.8 |
| | නොවැම්බර් | 126.4 | 1.3 | 8.4 |
| | දෙසැම්බර් | 126.6 | 0.2 | 7.3 |
| **2018** | ජනවාරි | 125.8 | -0.6 | 5.4 |
| | පෙබරවාරි | 123.7 | -1.7 | 3.2 |